# විරාගය නවකතාව පෙරපර දෙදිග සාහිත්‍යයික හා දර්ශනවාදවලින් ලබාගත් ආභාසය පිළිබඳ විමසීමක්

එස්. ජී. ප්‍රේමකුමාර[1]

මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විරාගය නවකතාව (1956) මනෝවිශ්ලේෂණාත්මක ඒක පුද්ගල ආත්ම වර්ණනාවක ස්වරූපයෙන් රචනා වූවකි. අරවින්ද ජයසේන නම් කතා නායකයාගේ ජීවිතය කේන්ද්‍ර කරගනිමින් නිර්මිත වූ මෙහි මිනිස් සිත ප්‍රතිවිරුද්ධ පදාර්ථයන්ගේ සංයෝගයක් බවත් ආධ්‍යාත්මික තතු හා ලෞකික ආශාවන් ගැටීම නිසා පුද්ගලයා විරාගිකයකු බවට පත්වන ආකාරයත් අපූර්ව ලෙස ඉදිරිපත් කර තිබේ. වික්‍රමසිංහ විරාගය රචනා කිරීමේ දී පෙරපර දෙදිග සාහිත්‍යය විචාරවාද හා දර්ශනවාදවලින් පෝෂණය වූ ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. ඇතැම් විද්වතුන් පවසන ආකාරයට වික්‍රමසිංහ විරාගය රචනා කිරීමේ දී පෙරදිග චිරන්තන ගද්‍ය සාහිත්‍යයෙන් ආභාසය ලබා තිබේ. ඊට අමතර ව ඔහු යුරෝපයේ ජීන් පෝල් සාත්‍රෙ, ඇල්බෙයා කැමූ වැනි දාර්ශනිකයන් ඉදිරිපත් කළ සාංදෘෂ්ටිකවාදී දර්ශනයේ ආභාසය ද ලබා තිබෙන බව විචාරකයෝ පවසති. වික්‍රමසිංහගේ විරාගය සහ රුසියන් සාහිත්‍යයට අයත් ඇතැම් නිර්මාණ අධ්‍යයනය කරමින් සිදු කළ මේ පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි විරාගය නවකතාව නිර්මාණය කිරීමේ දී ඉහත සඳහන් කරන ලද පෙරදිග චිරන්තන ගද්‍ය සම්ප්‍රදායයේ ආභාසය සහ යුරෝපීය සාංදෘෂ්ටිකවාදයේ ආභාසයට අමතර ව ඇන්ටන් චෙකොෆ්, ප්‍යෝදර් දොස්තයෙව්ස්කි සහ ලියෝ ටෝල්ස්ටෝයි වැනි විශිෂ්ට රුසියානු ලේඛකයන්ගේ නිර්මාණකරණයේ ආභාසය ද ලබා තිබෙන බව නිරීක්ෂණයට හසු විය. විරාගය නිර්මාණය කිරීමේ දී කතුවරයාට තිබූ මේ බහුශ්‍රැතභාවය නිසා ම එය විශිෂ්ට කෘතියක් වශයෙන් සම්භාවනාවට පාත්‍ර වී ඇති බව මේ අධ්‍යයනයෙන් හෙළි වේ.

**ප්‍රමුඛ පදඃ** වික්‍රමසිංහ, විරාගය, පෙරදිග සාහිත්‍ය, සාංදෘෂ්ටිකවාදය, රුසියානු සාහිත්‍ය

[1] සිංහල අධ්‍යයනාංශය